# 6. පෙරමග දූත සේවය

**මිනිසා පාපයෙන් ගලවා ගැනීම උදෙසා ජේසුස් වහන්සේ මෙලොවට වැඩිය සේක. මෙය දේව සැලැස්මට අනුව සිදු වූවකි. පාපය හඳුනා ගෙන ඉන් මිදීමට මග පෙන්වීමත් මනස්ථාපනය වීමට සැලැස්වීමත් ස්නාවක ජොහාන්තුමාගේ මූලික කාර්යය විය. එම කාර්යය ජේසුස් වහන්සේගේ මෙහෙවරට මූලික පසුබිම සකස් කිරීම උදෙසා ම විය. මෙම පාඩමෙන් විමසා බැලෙන්නේ ස්නාවක ජොහාන්තුමාගේ එම පෙර මග දූත මෙහෙවර පිළිබඳව ය.**

**ශු. ලූක් 3ඃ 1-20**

ජුදෙව් බලාපොරොත්තුව වූ මෙසියස් වහන්සේගේ පැමිණීම අපේක්ෂිත ව සිටි එම ජනතාවට එය සිදු වීමට ආසන්න බව දැන ගන්නට හරිමින්, ස්නාවක ජොහාන්තුමා ජේසුස් වහන්සේගේ මෙහෙවර වෙනුවෙන් පෙර මග දූත කාර්යය ඉටු කරන ලදි.

රෝම අධිරාජ්‍යයාට යටත් ව තිබූ ප්‍රදේශ වන ජුදය, ගලීලය, ඉතුරය, ත්‍රිකෝනිය සහ අබිලේනය යන ප්‍රදේශවල ජීවත් වූ ජනතාව වෙත, මූලික ලෙස ස්නාවක ජොහාන්තුමාගේ පණිවුඩය යොමු විණි.

ස්නාවක ජොහාන්තුමාගේ කාලය තුළ, එවකට සිටි, ජුදා ආගමික උත්තම පූජක පදවිය ලබා සිටියේ කායාපස් ය. රෝම අධිරාජ්‍යය පවත්වා ගෙන යෑම සඳහා පැවති නීති රීති, බදු බර ජුදෙව් ජනතාව පීඩනයට පත් කරන ලදි. එසේ ම ආගමික නායකයන් ජුදා ආගමික පැවැත්ම ශක්තිමත් කිරීමට වඩා, නිරතුරුව ම රෝම අධිරාජ්‍යයාගේ අවශ්‍යතා අනුව ක්‍රියා කරමින්, තම බලය සුරක්ෂිත කර ගැනිමට ක්‍රියා කළහ. මෙම තත්වය තුළ ජනතාවගේ ජීවිතවල වෙනසක් ඇති කිරීම සඳහා ස්නාවක ජොහාන්තුමා විසින් තම අභියෝගාත්මක පණිවුඩය ගෙනෙන ලදි. එම ප්‍රදේශවල ජීවත් වූවන්ගෙන් විවිධ බදු අය කරන ලදි. මෙම බදු බර සෙනග පිට පැටවීම නිසා ජනතාව අතර රෝම අධිරාජ්‍ය පාලනයට විරුද්ධව රට තුළ, ජනතාව අතර නොසන්සුන් කමක් මේ කාල වකවානුව තුළ පැවතුණි.

ස්නාවක ජොහාන්තුමාගේ උපත මෙන්ම ජීවිතය හා සේවය ද දේව සැලැස්මට අනුව සිදු වූ ආකාරය හඳුනා ගත හැකි ය. ඔබ මේ වන විට මීට පෙර පාඩම් තුළින් එය අධ්‍යයනය කර තිබේ.

දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ජීවත් වීම උදෙසා ජීවිත පරිවර්තනයක්, නවතාවයක් ඇතිකර ගැනීම සංකේතවත් කරමින්, ඊට බාහිර ලකුණක් ලෙසට බෞතීස්මය ලබා දෙන ලදි.

මෙම මනස්ථාපනයේ බෞතීස්මය, එතුමා ජුදා ජන කොටසට පමණක් සීමා නොකරමින්, සියලු ම ජන කොටස්වලට ජොර්දාන් ගඟෙන් බෞතීස්මය ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදි.

ස්නාවක ජොහාන්තුමාගේ මූලික පරමාර්ථය වූයේ, ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ ලෙසට පිළිගැනීමට අවශ්‍ය කරන, පසුබිම සකස් කිරීම යි. ඒ සඳහා මිනිස් ජීවිත වෙනසක් කරා යොමු කිරීම යි. ඒ සඳහා සෙනග වෙත ලබා දුන් අනුශාසනා සහ අභියෝග අපි දැන් අධ්‍යයනය කරමු.

## 1. පොදු ජනතාවට

ජනතාව - **"එසේ නම් අප කුමක් කළ යුතු ද ?"**

ස්නාවක ජොහාන් - **"අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා !
කෑම ඇති අය කෑම නැති අයට දෙත්වා !" ශු. ලූක් 3: 10**

දිවැසිවර යෙසායා පෙන්වා දී ඇති ලෙසට වංගු, රළු, කඳු හෙල් සේ හඳුනා ගත හැකි ජීවිතය තුළ ඇති විවිධ දේව රාජ්‍යයට නුසුදුසු ගුණාංග වෙනස් විය යුතුය. එවැනි අයහපත් ජීවිත පැවැත්ම ජේසුස් වහන්සේ පිළිගැනීමට බාධාවකි. ජේසුස් වහන්සේගේ සේවයේ පෙර මග සකස් කරමින් මිනිස් ජීවිත පැවැත්ම යහපතට යොමු කිරීමට ස්නාවක ජොහාන්තුමා මෙලෙස ක්‍රියා කාරි විය.

ස්නාවක ජොහාන්තුමා ජනතාවට දුන් මෙම අනුශාසනාව මගින් බෙදා ගැනීම පිළිබඳ ව අවධාරණය කරයි. "අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා. කෑම ඇති අය නැති අයට දෙත්වා" යන ප්‍රකාශයෙන් ඇති නැති පරතය පවතින සමාජයකට වෙනසක් කරා මග පෙන්වයි. එම වෙනස නම් තමා සතු දේ අන්‍යයන් සමග (නැති අය සමග) බෙදා ගැනීම යි. බෙදා ගනිමින් එකිනෙකා රැක ගැනීම, පෝෂණය කිරීම, උතුම් ගුණාංගයක් ලෙසට මෙහි දී පෙන්වා දෙනු ලබයි.

පුද්ගලික සිත් වෙනසකුත්, ආත්මාර්ථකාමී ලෙසට තමන් ගැන පමණක් නොසිතා එකිනෙකා රැක බලා ගනු ලබන සමාජයක් ද බිහිවිය යුතු ය. එකිනෙකාගේ අවශ්‍යතා සපුරන, නව ජීවිත පරිවර්තනයක් සඳහා අභියෝග මින් ගෙනෙනු ලබයි.

## 2. රාජ්‍ය සේවයේ යෙදී සිටි අයට

අය කැමියන් - **"ගුරු දේවයිනි අප කුමක් කළ යුතු ද?"**

ස්නාවක ජොහාන්තුමා - **"නියමිත පමණට වැඩියෙන් අය බදු අය නොකරන්න" ශු. ලූක් 3: 12**

ස්නාවක ජොහාන්තුමාගේ මනස්ථාපනයේ පණිවුඩය තුළින් සමාජයේ විවිධ ක්ෂේත්‍රවල සේවය කළ අයගේ ජීවිත වෙනස් කර ගැනීමට ද අභියෝග කළේ ය. රෝම අධිරාජ්‍යයා වෙනුවෙන් බදු අය කරන්නන් ජුදා ජනතාවගේ ප්‍රසාදයට ලක් නොවී ය. අයකැමියන් නීතියට පිටින් මුදල් වැඩිපුර අය කිරීම සිදු වූ බව ස්නාවක ජොහාන් තුමාගේ අත්දැකීම ද වන්නට ඇත. වංචනික භාවයෙන් තොර ව සාධාරණ ව හා අවංක ලෙස සේවයේ යෙදෙමින් යුක්ති ගරුක ජීවිතයක් සඳහා වෙනස් විය යුතු බව පෙන්වා දුන් හ. ජේසුස් වහන්සේගේ මෙහෙයේ පෙර මග දූත සේවයේ යෙදුණ ස්නාවක ජොහාන්තුමා, මෙවැනි කණ්ඩායම් වෙත, මනස්ථාපනයේ බෞතීස්මය දීම තුළින් රටේ යහපත් පැවැත්මට එක්වීමට ආරාධනා කළේ ය.

## 3. ආරක්‍ෂක අංශය

හේවායෝ - **"ඉතින් අප කුමක් කළ යුතු ද ?"**

ස්නාවක ජොහාන් - **"කිසිවකුගෙන් බලහත්කාරයෙන්වත්, කිසිවක් පැහැර නොගන්න. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න"**
**ශු. ලූක් 3ඃ 14**

රෝම හේවායන්, රෝම අධිරාජ්‍යය වෙනුවෙන් ආරක්ෂක සේවයේ නිරත වූ අය යි. මෙම අභියෝගාත්මක අනුශාසනාව තුළ එදා රෝම හේවායින් සමහරෙක් ක්‍රියා කර තිබෙන අයහපත් කටයුතු දෙකක් පෙන්වයි. එනම් තම නිල බලය යොදාගනිමින් බලහත්කාරයෙන් ජනතාවගේ දේවල් ලබා ගැනීම සහ තම වැටුපෙන් සෑහීමට පත් නොවී තම නිල බලය යොදමින් ජනතාවගෙන් මූල්‍යමය වාසි ලබා ගැනීම යි. ස්නාවක ජොහාන්තුමා මෙය ප්‍රතික්ෂේප කරයි. රෝම හේවායන් තම රැකියාව තුළ අවංක සමාජයට හිතකර සේවයක් කළ යුතු බව පෙන්වා දෙයි.

බලය පවතින විට දී, එය නිසි ලෙස හා සාධාරණ ලෙසට භාවිත කිරීම අවශ්‍ය ය. එවිට සමජයේ සැම අයකුට ම, බියෙන් තොර ව ආරක්ෂිත ව ජීවත් විය හැකි ය. එවැනි සමාජයක් ගොඩ නැංවීමට, මනස්ථාපනයෙන් යුතු ව නවතාවයකින් තම රැකියාවේ නියැලීමට අභියෝගයක් ගෙන දෙයි. රටේ පාලන තන්ත්‍රයේ විශේෂ අංශයක් වූ රාජ්‍ය ආරක්ෂක අංශයේ යෙදෙන්නවුන්ගේ ජීවිත/ප්‍රතිපත්ති වෙනසක් අවශ්‍ය බව මින් පෙන්වා දී ඇත.

## 4. ජුදා ආගමික ජනතාවට

**"එබැවින් ආබ්‍රහම් අපගේ පියාණෝ යයි**
**සිතින් කියා නොගෙන,**
**මනස්ථාපනය වූ බව දැක්වෙන ලෙස හැසිරෙන්න.**
**මන්ද මේ ගල්වලින් ආබ්‍රහම්ට දරු පරපුරක් උපදවා දෙන්නට**
**දෙවියන් වහන්සේට හැකි යයි මම ඔබට කියමි"**
**ශු. ලූක් 3ඃ 8**

ජුදා ආගමික ජනතාව ආබ්‍රහම්, තම පියාණන් ලෙසට හඳුන්වා ගත්හ. නමුත් මෙහි දී ස්නාවක ජොහාන්තුමා මතක් කර දෙන්නේ, එය වචනයට පමණක් සීමා නොවිය යුතු බව යි. ආබ්‍රහම්තුමා දෙවියන් වහන්සේ සමග තිබූ සබඳතාවය මෙන් ඇදහිල්ලේ සබඳතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය බව පෙන්වා දෙයි.

ආබ්‍රහම් දෙවියන් වහන්සේ අදහා ගනිමින්, විශ්වාස කරමින්, දේව කැමැත්තට අනුව ක්‍රියා කරන ලදි. මෙය ක්‍රියාකාරී අර්ථාන්විත ඇදහිල්ලක් සඳහා ගෙන ආ අනුශාසනාවකි.

ඉහත දැක්වෙන අනුශාසනා කරමින්, ස්නාවක ජොහාන්තුමා තමා වෙතට පැමිණි ජනතාවට ජොර්දාන් ගඟෙහි බෞතීස්මය ලබා දුන්නේ ය.

මේ වන විට ජනතාව නැගූ ප්‍රශ්නය වූයේ ජුදෙව් බලාපොරොත්තුව අනුව මෙසියස් වහන්සේ මෙතුමා ද යන්න යි. එම ගැටළුව ඉතා පැහැදිළි ලෙසට එතුමා විසඳාලමින්, ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ටත්වය පිළිබඳ පැහැදිළි ලෙස ප්‍රකාශ කළ සේක. "එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේ ය, එතුමාණන්ගේ පාවහන් පටි මුදන්ටවත් මම නොවටිමි." (ශු. ලූක් 3: 16) මෙම ප්‍රකාශය තුළින් ස්නාවක ජොහාන්තුමා ජේසුස් වහන්සේගේ පෙර මග දූත සේවය, මනස්ථාපනයේ බෞතීස්මය තුළින් සිදු කළ බවත්, තම කාර්යයභාරය ඉතා හොඳින් හඳුනා ගෙන සිටි බවත් පෙනී යයි. එසේ ම එතුමාගේ යටහත් පහත් භාවය ද මෙහි දී අවධාරණය වෙයි.

"කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත්, ධාන්‍ය පොලා සිය අටුවේ රැස් කරන පිණිසත්, උන්වහන්සේගේ අතේ කුල්ල ඇත. එහෙත් බොල් නොනිමෙන ගින්නෙහි දවාලනු ලැබේ" (ශු.ලූක් 3: 17) මිනිස් ජීවිතය පිළිබඳ ව අවසාන තීරණය ගැනෙන්නේ ජේසුස් වහන්සේ විසින් ය. ඉතා ආනුභාවසම්පන්න ජේසුස් වහන්සේ විනිශ්චය කිරීමේ බලය සතුව එන සේක. එම විනිශ්චයට ලක්වන ජනතාව, පෙර සූදානම් කරමින්, මනස්ථාපනය කාර්යය තුළින්, ජීවිත වෙනස් කිරීමකට මග පෑදීම පමණක් තම සේවය බව මෙහි දී ප්‍රකාශ කරයි. මෙම ප්‍රකාශනයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රේෂ්ටත්වය පිළිබඳ දැනුම් මාත්‍රයක් ජනතාවට ලබා දුන්නේ ය.

"එතුමාණෝ ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද බෞතීස්ම කරන සේක. (ශු. ලූක් 3: 16) ස්නාවක ජොහාන්තුමාගේ මනස්ථාපනයේ බෞතීස්මය ජලයෙන් සිදු කළ ද ක්‍රිස්තුස් වහන්සේ විසින් ශුද්ධාත්මයාණන්ගෙන් ද, ගින්නෙන් ද බෞතීස්මය සිදු කරනු ලබන බව ස්නාවක ජොහාන් තුමාගේ පණිවුඩය විය. මෙම ජීවිත පවිත්‍ර කිරීමේ කාර්යය ඉතා බලවත් බව ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද යන ප්‍රකාශයෙන් ජනතාවට ජොහාන්තුමා පැහැදිලි කරන ලදි. පැරණි ගිවිසුමෙහි දෙවියන් වහන්සේගේ වැඩ සිටීම 'ගින්න' මගින් සංකේතවත් කරයි. මෝසෙස්තුමාගේ කැඳවීමේ දී 'ඇවිලෙන ගිනි පඳුරෙන්' එය වඩාත් පැහැදිලි වේ. එසේම ශුද්ධාත්මයාණන් වහන්සේ මිනිස් හදවතේ ඇති අපවිත්‍ර දේ ඉවත් කරමින්, පුළුස්සමින් ජීවිත අළුත් කිරීමක් සිදු කරන සේක.

ස්නාවක ජොහාන්තුමාගේ මනස්ථාපනයේ පණිවුඩය හා සමග දුන්, අනුශාසනාව හා අනතුරු ඇඟවීම් ප්‍රතික්ෂේප කළ අය ද සිටියහ. හෙරෝද් රජතුමා, ඔහුගේ සොහොයුරාගේ බිරිඳ වූ හෙරෝදියස් සම්බන්ධ ව ක්‍රියා කර තිබෙන පිළිවෙළ පිළිබඳ ව කථා කරමින්, හෙරොද්ගේ දුෂ්ටකම ගැන තරවටු කළේ ය. හෙරොද් රජතුමා එය ප්‍රතික්ෂේප කළා පමණක් නොව, ස්නාවක ජොහාන්තුමා ව සිරගත කර, මරණයට පත් කළේ ය. එයින් පැහැදිලි වන්නේ ස්නාවක ජොහාන්තුමාගේ මරණය පවා සිදු වුණේ මෙම මනස්ථාපනයේ පණිවුඩය කරණකොට ගෙන බව ය. මෙහි දී අපට පෙනෙන්නේ ස්නාවක ජොහාන්තුමා ඉතා එඩිතර ව පාපයෙන් මිදෙන්නට අනුශාසනා හා තරවටු කළ බව යි. එම නිසා එතුමාගේ මනස්ථාපනයේ පණිවුඩය ඉතා බලවත් වූවා සේ ම ජේසුස් වහන්සේගේ මෙහෙවරට අවශ්‍යය පසුබිම ද සකස් කර දෙන ලදි.

අද සමාජයේ වෙසෙන සැම කොටසකට ම ස්නාවක ජොහාන්තුමාගේ අනුශාසනා සහ තරවටු අදාළ වේ. ඒ තුළින් එල්ල වූ අභියෝග මගින් සහෝදරත්වයෙන් යුතු ව, ආත්මාර්ථකාමී නොවී, තමාට ඇති දේ බෙදා ගනිමින්, එකිනෙකාව පෝෂණය කරමින්, ජීවත් වීම සඳහා ජීවිත වෙනසක් ඇති කර ගැනීමට මග පෙන්වීමක් ලැබේ.

සමාජය තුළ තමා කරන ඕනෑම කාර්යය භාරයක දී අවංකව, කාර්යක්ෂම ව තරාතිරම් නොබලමින්, ලාභ නොතකා, සාධාරණ ව හා යුක්ති ගරුක ව සේවය කිරීම අවශ්‍ය ය. වරද පවතින ස්ථානවල දී එය නිවැරදි කිරීමට වෑයම් කරමින්, යහ ගුණ පිරි සමාජයක් උදෙසා ක්‍රියාකාරී වීම ගුණ ගරුක පුරවැසියන්ගේ යුතුකමකි.

පාසලේ ඉගෙනුම ලබමින්, හැදෙන වැඩෙන ඔබට සමාජය තුළ නව පරිවර්තනයක් ඇති කිරීම සඳහා ස්නාවක ජොහාන්තුමාගේ මනස්ථාපනයේ පණිවුඩය මහත් අභියෝගයක් වනු ඇත. අයහපත් ක්‍රියාවනට යොමු වන අවස්ථාවල දී මනස්ථාපනයේ පණිවුඩය සිහිපත් කර ගන්න. එවිට අභියෝග ඉදිරියෙහි යහපත් මාර්ගයට යොමු වීමට මගපෙන්වීම ලැබෙනු ඇත.

## ක්‍රියාකාරකම

1. ස්නාවක ජොහාන්තුමාගේ පෙර මග දූත සේවයේ දී, විවිධ කණ්ඩායම්වලට දුන් අනුශාසනා අද සමාජයට කොතෙක් දුරට සම්බන්ධ කළ හැකි ද යන්න සංසන්දනාත්මක ව ඉදිරිපත් කරන්න.

2. ඔබගේ ජීවිතයේ වෙනස්විය යුතු ගති පැවතුම් හඳුනාගනිමින්, මනස්ථාපනය වෙමින්, ජේසුස් වහන්සේගේ පාමුල දී ගන්නා වූ අලුත් තීරණ මොනවා දැයි ලියා දක්වන්න.